සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 4 දක්වා ප්‍රශ්න වල පහත ගායනා ඇසුරින් පිළිතුරු ලියන්න.

A. අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රි කුමාරි බඳී
දෙවෝපකාර වෙවා සැදී සෙත්

B. අහසින් අවුත් මණිඅක් නයිඳු යැඳුමට
රහතන් මැදෙහි මුණි හිඳ මිණි පළඟ පිට

C. වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ

D. කවුරුද ලෙඩ වෙන්නේ
මමයි බෙහෙත් දෙන්නේ
මේකෙන් එකක් විදින්නේ
ඌයි අම්මෝ කියන්නේ

01. නාට්‍ය ගීත සඳහන්ව ඇති අක්ෂරය වන්නේ,
i. A හා B ය. ii. A හා C ය. iii. A හා D ය. iv. B හා D ය.

02. සිරිත් මල්දමට අයත් කවියක් සඳහන්ව ඇති අක්ෂර වන්නේ,
i. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

03. ඓතිහාසික සිද්ධියක් පදනම් කරගත් කවියක් සඳහන් ව ඇති අක්ෂරය වන්නේ,
i. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

04. "අමර ගියා දිව්‍යලෝකෙ" නාට්‍යයට අයත් ගීත කොටසක් සඳහන්ව ඇති අක්ෂරය වන්නේ,
i. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

- ප්‍රශ්න අංක 5 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

05. නිර්මාණකරණයේ දී පරිකල්පනය ලෙස හඳුන්වන්නේ,
i. සිහින දැකීමයි. ii. සිතෙන් මවා ගැනීමයි. iii. කල්පනා කිරීමයි. iv. ලියාදැක්වීමයි.

06. චරිත නිරූපණයේ දී වඩාත් වැදගත් වන්නේ.
i. වර්ණ ගැන්වීමයි ii. ඇඳුම් ඇඳීමයි. iii. ගීත ගායනා කිරීමයි. iv. අනුකරණය කිරීමයි.

07. නාට්‍යයක් සඳහා ගීත යොදා ගන්නේ,

i. හිස් බව නැති කිරීමටයි. ii. විනෝදය සැපයීමටයි.

iii. අවස්ථා ඉස්මතු කිරීමටයි. iv. නර්තනය සැපයීමටයි.

08. වෙස් වලාගෙන, රටේ නොයෙක් තැන සංචාරය කරමින් ජනතා ප්‍රශ්න විසඳූ රජතුමෙකු ගැන ඓතිහාසික කතා පුවතක් ඇත. එම රජතුමා වනුයේ,

i. දුටුගැමුණු රජතුමා ii. කාවන්තිස්ස රජතුමා

iii. ගජබා රජතුමා iv. දේවානම්පියතිස්ස රජතුමා

09. නාට්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු ඓතිහාසික කතාවක් නොවන්නේ,

i. දසමහා යෝධයින්ගේ කතා. ii. දුටුගැමුණු රජතුමාගේ කතා

iii. කාවන්තිස්ස රජතුමාගේ කතා. iv. සුරංගනා කතා

10. සිරිසඟබෝධි මාළිගාවේදී ..... යන ගීතය ඇතුලත් වන්නේ,

i. රාමායන නූර්තියේ ය. ii. සිරිසඟබෝ නූර්තියේ ය.

iii. වෙස්සන්තර නූර්තියේ ය. iv. සංගබෝධි ජාතකයේ ය.

**• අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල ඇති හිස්තැන්, වරහන් තුළ දී ඇති වචන යොදා සම්පූර්ණ කරන්න.**

(කාටූන්, සත්ව, සිරි පැරකුම්, අනුකරණය, රූපවාහිනිය, රංග භූමිය)

11. ................................................ ඓතිහාසික කතාවක් පදනම් වූ චිත්‍රපටයකි.

12. බකමූණාගේ හඬ ............................................ පහසු ය.

13. සිංහයා ................................................ චරිතයකි.

14. Animation (රූප) යොදා ගන්නේ ................................................ සඳහා ය.

15. ................................................ තුළ නාට්‍ය රඟ දක්වයි.

**• ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා A හා B කොටස් වල දී ඇති වචන ගැළපෙන ලෙස යා කරන්න.**

| A | B |
|---|---|
| 16. සින්ඩරෙල්ලා | • මාර්ගය |
| 17. දොස්තර මාමා | • විජය |
| 18. කුවේණි | • සංවාද |
| 19. වීදි නාට්‍ය | • අමර |
| 20. දෙබස් | • ළමා කතා |

(ලකුණු 20×1= 20)

## II කොටස

● **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුලුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.**



A



B



C

01) i. ඉහත අක්ෂර වලින් දක්වා ඇති දෑ හඳුන්වන පොදු නම කුමක්ද? (ලකුණු 02)

ii. ඉහත පින්තූර වලින් දක්වා ඇති ආභරණ 2ක් නම් කරන්න. (ලකුණු 02)

iii. පංති කාමරයේ දී ඔබ විසින් එකී දෑ සකස් කිරීම සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය 4ක් නම් කරන්න. (ලකුණු 02)

iv. ඉහත උපකරණ / භාණ්ඩ සකස් කිරීමේ දී ඔබ විසින් අවධානය යොමු කළ යුතු කරුණු 2ක් ලියන්න. (ලකුණු 02)

v. ඉහත දක්වා ඇති භාණ්ඩ / උපකරණ භාවිතා කරමින් රංගනය කිරීමට සුදුසු චරිත 2ක් නම් කරන්න. (ලකුණු 02)

02) i. ක්ෂණික නිරූපණයක් ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 02)

ii. පංති කාමරය තුළ ඔබ විසින් නිරූපණය කරනු ලැබූ ක්ෂණික නිරූපණ අවස්ථා 3ක් නම් කරන්න. (ලකුණු 03)

iii. ක්ෂණික නිරූපණයන් හි නිරත වීමෙන් නළුවාට ලැබෙන ප්‍රයෝජන 2ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03) i. පංති කාමරයේ දී ඔබ නිරත වූ හඬ අභ්‍යාසයක් නම් කරන්න. (ලකුණු 02)

ii. හඬ අභ්‍යාස වල නිරත වීමෙන් නළුවෙකු හට ලබා ගත හැකි ප්‍රයෝජන 3ක් ලියන්න. (ලකුණු 03)

iii. ඔබ ඉහත 1 කොටසෙහි නම් කළ අභ්‍යාසයෙහි නිරත වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04) i. ශ්‍රව්‍ය මාධ්‍යයක් හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

ii. ටෙලි නාට්‍ය හා චිත්‍රපට අතර ඇති අසමානතා 3ක් ලියන්න. (ලකුණු 03)

iii. "වේදිකා නාට්‍යයක සුවිශේෂතා" යන මාතෘකාව යටතේ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

05) ඔබ දන්නා රසවත් ඓතිහාසික කතාවක් පාදක කරගනිමින් නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ඒ සඳහා සංවාද, චරිත, ගැටුම්, අවස්ථා, රංග විධාන ඇතුළත් කොට නාට්‍යට සුදුසු නමක් ද යොදන්න) (ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

# නාට්‍ය හා රංග කලාව

නම / විභාග අංකය:

### ප්‍රායෝගික පරීක්ෂණය

01) නාට්‍ය ගීතයක් ගායනා කරමින් රංගනයේ යෙදෙන්න. (ලකුණු 15)

02) පහත සඳහන් චරිත අතුරින් එක් චරිතයක් නිරූපණය කරන්න.

- කැදර ළමයෙක්
- සැර පරුෂ හෙදියක්
- මසුරු ආච්චි කෙනෙක්
- නපුරු කුඩම්මා කෙනෙක්
- මසුරු වෙළෙන්දෙක්
- කපටි හිඟන්නෙක් (ලකුණු 10)

03) කණ්ඩායම් ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කරන්න. (පහත එක් අවස්ථාවක් උපයෝගී කර ගන්න.)

- වෙළෙඳ පොළක කලබලයක්
- මළ ගෙදරක අවස්ථාවක්
- අලුත් අවුරුදු උත්සවයක්
- T.V වැඩසටහනක් (ලකුණු 10)

04) අමර ගියා දිව්‍යලෝකේ නාට්‍යයේ ඔබ කැමති චරිතයක් පිටපතෙහි සඳහන් සංවාද සහිතව නිරූපණය කරන්න. (ලකුණු 10)